රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 05/2017

මගේ අංකය : EST-5/3/17- VI
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2017.09.25

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය සේවයේ එක් සේවාවක හෝ තනතුරක සිට රාජ්‍ය සේවයේ වෙනත් සේවාවකට හෝ තනතුරකට පත් වූ නිලධරයන්ගේ වැටුප් සැකසීම

රාජ්‍ය සේවයේ එක් සේවාවක හෝ තනතුරක සිට තවත් සේවාවකට හෝ තනතුරකට පත්වීම් ලබන නිලධරයන්ගේ වැටුප් සැකසීමේ දී විවිධ ගැටලු පවතින බවට මා වෙත ඉදිරිපත් වන තොරතුරු අනුව නිරීක්ෂණය වී ඇත.

02. ඒ අනුව රාජ්‍ය සේවයේ යම් සේවාවකට හෝ තනතුරකට අදාළ සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීම් පරිපාටියේ බඳවා ගැනීම් ක්‍රමවේදය අනුව සීමිත හෝ කුසලතා පදනම මත යම් බඳවා ගැනීම් ප්‍රතිශතයක් වෙන් කර ඇති විටක දී හා එම වෙන් කළ ප්‍රතිශතය යටතේ එම සේවයට හෝ තනතුරට පත්වීමට නිශ්චිතව නම් කළ වෙනත් සේවාවක/ තනතුරක සිට පත්වීම් ලබන නිලධරයකුගේ වැටුප සකස් කිරීමේ දී ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයෙහි 5 වගන්තියෙහි විධිවිධාන අදාළ කරගෙන වැටුප සකස් කළ යුතු අතර එසේ සීමිත හෝ කුසලතා බඳවා ගැනීමක් නොවන බඳවා ගැනීමක් මත යම් සේවාවකට/ තනතුරකට පත්වීම් ලබන විට රජයේ සේවයේ කිසියම් සේවයක හෝ තනතුරක සිටි නිලධරයකුගේ වැටුප ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයෙහි 9 වගන්තියෙහි විධිවිධාන පරිදි සකස් කළ යුතුය. තව ද, ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයෙහි 9 වගන්තියෙහි විධිවිධාන අනුව වැටුප් සකස් කිරීමේ දී යම් නිලධරයකු පූර්ව තනතුරේ ලබමින් සිටි වැටුපට වඩා අඩු වැටුප් පියවරයක් හිමි විය හැකි නමුත් එය වැටුප් විෂමතාවක් ලෙස සලකනු නොලැබේ.

03. මෙම විධිවිධාන පිළිබඳව ඔබ යටතේ සිටින සියලු නිලධරයන් දැනුම්වත් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය